සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර III විභාගය - 2026 ජනවාරි

(304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate & Personal Taxation)

2026-02-08
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
උත්තර ලිවීම සඳහා - පැය 03 යි.

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

A කොටස

(මුළු ලකුණු 20)

01 වන ප්‍රශ්නය

සීමාසහිත රාජේෂ් ඩේරි සමාගම, ඉන්දියාවේ තිබෙන විශාලතම කිරි නිෂ්පාදන සමාගම්වලින් එකකි. ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද සමාගමක් වන **සීමාසහිත ක්‍රිසුදු (පෞද්ගලික) සමාගම**, **සීමාසහිත රාජේෂ් ඩේරි සමාගමෙහි** පරිපාලිත සමාගමක් වන අතර, එය දේශීය වෙළෙඳපොළ සඳහා කිරි නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයේ නිරතව සිටියි. **සීමාසහිත ක්‍රිසුදු (පෞද්ගලික) සමාගම** කිරි නිපදවීම සඳහා **සීමාසහිත රාජේෂ් ඩේරි සමාගම** වෙතින් තාක්ෂණික වේදිකාවක් (technology platform) ලබාගැනීමට සැලසුම් කරයි. **සීමාසහිත ක්‍රිසුදු (පෞද්ගලික) සමාගම** විසින් තාක්ෂණය භාවිත කිරීම වෙනුවෙන්, **සීමාසහිත රාජේෂ් ඩේරි සමාගම** වෙත පුරස්කාරයක් (royalty) ගෙවිය යුතු වේ.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) ශ්‍රී ලංකාවේ ඇති **සීමාසහිත ක්‍රිසුදු (පෞද්ගලික) සමාගමේ** වාසිකභාවය **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) ශ්‍රී ලංකාවේ අදාල වන වක්‍ර බදු වර්ග දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

02 වන ප්‍රශ්නය

වෘත්තියෙන් වෛද්‍යවරයෙකු වන **තිශාන්ත**, ඔහුගේ පවුල සමඟ කැනඩාවට සංක්‍රමණය වීමට සැලසුම් කරයි. එමනිසා, **තිශාන්ත** 2024/25 තක්සේරු වර්ෂය තුළදී, පහත සඳහන් ප්‍රාග්ධන ස්වභාවයේ ගනුදෙනු සිදුකර තිබේ: *(රු.)*

වත්කම් වර්ගය	ඉදිකිරීමේ / අත්පත් කරගැනීමේ පිරිවැය	2017.09.30 දිනට වෙළෙඳපොළ අගය	ලැබුණු ප්‍රතිෂ්ඨාව	තැරව් ගාස්තු
2010 සිට පාවිච්චි කරන ලද වාසික නිවස (උරුමයෙන් ලද)	2,000,000	10,000,000	13,500,000	1,350,000
රබර් වත්ත (රබර්වලින් ආදායම් උපයන ලද)	5,000,000	6,300,000	8,100,000	810,000
මාතලේ පිහිටි හිස් ඉඩම (2014 දී මිලට ගත්)	9,400,000	11,850,000	16,470,000	1,947,000

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත ගනුදෙනු මත, **තිශාන්ත** විසින් ගෙවිය යුතු ප්‍රාග්ධන ලාභ බද්ද [(Capital Gain Tax) CGT] **ගණනය කරන්න**.

(සැ.යු. එක් එක් ගනුදෙනුව සඳහා ප්‍රාග්ධන ලාභ බද්ද සැලකීමට හෝ නොසලකා සිටීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුය.)

(ලකුණු 05)

03 වන ප්‍රශ්නය

කොළඹ පිහිටි ඉදිකිරීම් ආයතනයක් වන **X සහ සමාගම, අර්ජුන්** සහ **ප්‍රියාල්** විසින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයකි. ඔවුහු, ලාභා'ලාභ සම සමව බෙදා ගැනීමට එකඟ වී සිටිති. **අර්ජුන්** ඔහුගේ මිතුරෙකු වන **සමීර** සමඟ උප හවුල් ව්‍යාපාරයක් ඇති කරගැනීමට තීරණය කළේය. උප හවුල් ව්‍යාපාර ගිවිසුම යටතේ, **X සහ සමාගමේ, අර්ජුන්** ගේ ලාභයෙන් 25% ක් ලැබීමට **සමීර** හිමිකම් ලබයි. උප හවුල් ව්‍යාපාරය සඳහා **අර්ජුන්** සහ **සමීර** අතර වෙනම ගිවිසුමක් පවතින අතර, එය **ප්‍රියාල්ගේ** කොටසට බලපෑමක් නොකරයි.

ඔබ විසින් කළ යුතු දෑ:

"ඒ.ඒ. ඩාවුඩ්බෝයි එදිරිව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (A.A. Davoodbhoy Vs CGIR) නඩු තීන්දුව පදනම් කර ගනිමින්, **අර්ජුන්** සහ **සමීර** අතර ඇති කරගත් මෙම එකඟවීමේ ආදායම් බදු බලපෑම **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

04 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත මිලේනියම් හොටේල්ස් (පෞද්ගලික) සමාගම,** කොළඹ සංචාරක හෝටලයක් පවත්වාගෙන යයි. 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව තුළ, හෝටලය පහත සඳහන් ආදායම් මූලාශ්‍ර උපයාගෙන ඇති අතර, මුළු ආදායම මත, සේවා ගාස්තු ගණනය කෙරේ:

ආදායම් වර්ගය	රු.
කාමරවලින් ලද ආදායම	1,650,000
ආහාරපානවලින් ලද ආදායම	2,758,000
සම්භාහන මධ්‍යස්ථානයෙන් ලද ආදායම	876,500
මුළු ආදායම	**5,284,500**
සේවා ගාස්තුව	528,450
	5,812,950

ඔබ විසින් කළ යුතු දෑ:

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා, සංචාරක සංවර්ධන බද්ද [Tourism Development Levy (TDL)] **තක්සේරු කරන්න.**

(ලකුණු 03)

(B) **සීමාසහිත XYZ සමාගම, සීමාසහිත ABC පොදු සමාගමේ** (කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගමකි) නිල ලැයිස්තුගත කොටස්වල ආයෝජනය කර තිබේ. 2025 මාර්තු 10 වන දින, **සීමාසහිත ABC පොදු සමාගමෙහි** කොටස් 10,000 ක්, කොටසක් රු.35/- බැගින් **සීමාසහිත XYZ සමාගම** විසින් විකුණන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

සීමාසහිත XYZ සමාගම විසින් ගෙවිය යුතු කොටස් ගනුදෙනු බද්ද (share Transaction Levy) **ගණනය කරන්න.**

(ලකුණු 02)

(මුළු ලකුණු 05)

A කොටසෙහි අවසානය

B කොටස

(මුළු ලකුණු 30)

05 වන ප්‍රශ්නය

සීමාසහිත DGB (පෞද්ගලික) සමාගම, පාවහන් නිෂ්පාදනයේ සහ විකිණීමේ නිරතව සිටින අතර, එකතු කළ අගය මත බද්ද [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි සමාගමකි.

පහත සඳහන් තොරතුරු, 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදී:

(1) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව තුළදී, **සීමාසහිත DGB (පෞද්ගලික) සමාගම,** සිදුකළ විකුණුම් (VAT රහිතව) පිළිබඳ විස්තර පහත දැක්වේ:

	රු.
දේශීය විකුණුම්	36,672,000
අපනයන විකුණුම්	5,254,000

(2) කාර්තුව තුළදී පහත දැක්වෙන වෙනත් ආදායම් ද (VAT රහිතව) ලැබී තිබේ:

	රු.
පරිපාලිත සමාගමකින් ලද කුලී ආදායම (VAT සඳහා ලියාපදිංචි සමාගමක් නොවේ)	225,000
මෝටර් ලොරි රථයක් ඉවත් කිරීමෙන් ලද විකුණුම් මුදල	3,540,000

(3) කාර්තුව තුළදී සමාගම, පහත දැක්වෙන යෙදවුම් බදු ගෙවා තිබේ:

	රු.
අමුද්‍රව්‍ය ආනයනය මත	2,423,000
අමුද්‍රව්‍ය, දේශීය මිලට ගැනුම් මත	1,473,000
අධ්‍යක්ෂවරයෙකු විසින් භාවිත කළ මෝටර් කාර් රථයකට සිදුකළ අළුත්වැඩියා මත	32,000

(4) පෙර කාර්තුවෙන් ඉදිරියට ගෙන එන ලද වැඩිපුර ගෙවූ යෙදවුම් බද්ද (input VAT) රු.524,520/- කි.

(5) සමාගම, මාසික එකතු කළ අගය මත බදු, වාරික වශයෙන් රු.1,500,000/- ක් ගෙවා තිබේ.

(එකතු කළ අගය මත සම්මත බදු අනුපාතය 18% ක් ලෙස සළකන්න.)

ඔබ විසින් කළ යුතු දෑ:

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු / (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද **තක්සේරු කරන්න.**

(ලකුණු 10)

06 වන ප්‍රශ්නය

"Event Planners" යනු **රුවන්** සහ **මධු** යන හවුල්කරුවන් දෙදෙනෙකු විසින් පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයකි. ඔවුහු පිළිවෙලින් 3:2 යන අනුපාතයට ලාභා'ලාභ බෙදාගැනීමට එකඟ වී සිටිති. ව්‍යාපාරය, මංගල උත්සව, දානමය අවස්ථා සහ ආයතනික උත්සව වැනි විවිධ උත්සව කටයුතු සඳහා උපකරණ කුලියට සපයයි.

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතය පහත දැක්වේ:

	රු.
දළ ලාභය	25,200,000
වෙනත් ආදායම්:	
ස්ථාවර තැන්පතු මත පොලිය (දළ)	250,000
	25,450,000
වියදම්:	
පරිපාලන වියදම්	(5,250,000)
බෙදාහැරීමේ වියදම්	(3,100,000)
මූල්‍ය වියදම්	(650,000)
හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය	**16,450,000**

ඉහත ශුද්ධ ලාභය ගණනය කිරීමේදී, පහත සඳහන් වියදම් අඩුකරගෙන තිබේ:

(1) හවුල්කරුවන්ගේ වැටුප්:

රුවන් : රු.2,400,000/-

මධු : රු.3,600,000/-

(2) **මධුගේ** පුත්‍රයා හවුල් ව්‍යාපාරයේ කළමනාකරුවෙකු ලෙස සේවය කරන අතර, වර්ෂය තුළදී ඔහුට රු.1,000,000/- ක් ගෙවා තිබේ.

(3) **රුවන්** ට අයත් ලොරි රථයක්, උපකරණ බෙදාහැරීම සඳහා පාවිච්චි කරන අතර, ඔහුට මසකට රු.80,000/- ක කුලියක් ඒ සඳහා ගෙවා තිබේ.

(4) තක්සේරු වර්ෂය තුළදී, රු.300,000/- ක මුදලක්, රජයේ රෝහලකට පරිත්‍යාගයක් ලෙස ගෙවා තිබේ.

(5) වර්ෂය තුළදී, උසස් ශ්‍රව්‍ය උපකරණයක් (advanced audio equipment) රු.1,000,000/- ක පිරිවැයකට මිලදී ගත් අතර, එහි ක්ෂය වශයෙන් රු.100,000/- ක් පරිපාලනය වියදම් යටතේ වාර්තා කර තිබේ. අනෙකුත් සියළු වත්කම්, 2024 අප්‍රේල් 01 දිනට ගිණුම්කරණ අරමුණ සඳහා මෙන්ම බදු අරමුණ සඳහා ද සම්පූර්ණයෙන් ක්ෂය කර තිබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

2024/25 තක්සේරු වර්ෂය සඳහා, හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ආදායම් බද්ද **තක්සේරු කරන්න.** (ලකුණු 10)

07 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත සති ඩ්‍රින්ක්ස් (පෞද්ගලික) සමාගම,** ශ්‍රී ලංකාවේ වාසික සමාගමකි. සමාගම, 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අවසන් කර නොමැත. එමනිසා, 2024/25 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව නියමිත දින හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කර නොමැත.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) 2024/25 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත දිනය **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව, ආදායම් වාර්තාව ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම මත පැනවිය හැකි දණ්ඩණ (penalties) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(B) (a) 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 135 වන වගන්තිය යටතේ, සහකාර කොමසාරිස්වරයාට මුල් තක්සේරුවක් සංශෝධනය කර සංශෝධිත / අතිරේක තක්සේරුවක් නිකුත් කළ හැකි පහත අවස්ථාවන් සඳහා කාල කඩඉම් ප්‍රතිපාදන (time bar provisions) **සඳහන් කරන්න**:

(i) බදු ගෙවන්නා විසින් ස්වයං තක්සේරු වාර්තාවක් ගොනු කර ඇති විටෙක.

(ii) බදු ගෙවන්නා විසින් වංචාවක් හෝ බරපතල (gross) හෝ චේතනික (willful) නොසළකා හැරීමක් සිදුකර ඇති අවස්ථාවලදී. (ලකුණු 03)

(b) පෙර තක්සේරුවක (advance assessment) ඇතුලත් විය යුතු කරුණු දෙකක්(02) **සඳහන් කරන්න.**

(ලකුණු 02)

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

C කොටස

(මුළු ලකුණු 50)

08 වන ප්‍රශ්නය

සීමාසහිත ක්‍රිස්ටල් බෙවරේජස් (පෞද්ගලික) සමාගම, ශ්‍රී ලංකාවේ වාසික සමාගමක් වන අතර, බෝතල් කළ පළතුරු බීම නිෂ්පාදනයේ සහ විකිණීමේ ව්‍යාපාරයක නියැලී සිටියි.

පහත සඳහන් තොරතුරු, 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත ක්‍රිස්ටල් බෙවරේජස් (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලින් උපුටාගන්නා ලදී:

(1) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත ක්‍රිස්ටල් බෙවරේජස් (පෞද්ගලික) සමාගමේ** සාරාංශගත ආදායම් ප්‍රකාශනය පහත දැක්වේ:

	රු.
පිරිවැටුම	325,110,000
විකුණුම් පිරිවැය	(260,088,000)
දළ ලාභය	**65,022,000**
වෙනත් ආදායම්	25,890,000
බෙදාහැරීමේ වියදම්	(22,842,000)
පරිපාලන වියදම්	(35,470,000)
බද්දට පෙර ශුද්ධ ලාභය	**32,600,000**

(2) වෙනත් ආදායම්වල පහත දෑ ඇතුළත් වේ:

	රු.
ස්ථාවර තැන්පතු මත පොළී ආදායම (දළ)	8,950,000
ගබඩාව මත කුලී ආදායම (දළ)	16,940,000

(3) පරිපාලන වියදම් හි පහත දෑ ඇතුළත් වේ:

- වර්ෂය සඳහා ක්ෂය අය කිරීම රු.8,870,000/- කි.
- වර්ෂය සඳහා පාරිතෝෂික වෙන් කිරීම රු.2,500,000/- කි.
- සංග්‍රහ වියදම් රු.750,000/- කි. එහි සේවාදායකයෙකු (client's) පිළිගැනීම වෙනුවෙන් ගෙවූ රු.300,000/- ක්ද, සමාගමේ වාර්ෂික සේවක විනෝද චාරිකාව සඳහා නිවාඩු නිකේතනයකට ගෙවූ රු.450,000/- ක්ද එහි ඇතුළත් වේ.
- නව නිෂ්පාදන පිරියතක් පරීක්ෂා කිරීම සඳහා කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ විදේශ ගමන් වියදම් මත රු.800,000/- ක් දරා තිබේ.
- මෝටර් ලොරි රථයක් විකිණීමෙන් වූ ගිණුම්කරණ අලාභය රු.150,000/- කි.
- නීති සහ වෘත්තීය ගාස්තු රු.650,000/- කි. මෙහි නව වෙළෙඳ ලකුණක් ලියාපදිංචි කිරීමට සම්බන්ධ රු.200,000/- ක් ඇතුළත් වන අතර, ඉතිරි මුදල සාමාන්‍ය විගණනය සහ නීති උපදේශන සේවා සඳහා වේ.

(4) බෙදාහැරීමේ වියදම් තුළ පහත දෑ ඇතුළත් වේ:

- බුන්වත්භාවය ප්‍රකාශ කළ ගනුදෙනුකරුවෙකු වෙනුවෙන් ආදායම් ප්‍රකාශයට සෘජුවම ලියා හළ බොල් ණය රු.150,000/- කි. ඊට අමතරව, රු.95,000/- ක පොදු ප්‍රතිපාදනයක් ආදායම් ප්‍රකාශනයට සිදුකර තිබේ.
- නියමිත වේලාවට ආදායම් බදු නොගෙවීම මත, දඩ මුදල් හා දණ්ඩණ ලෙස රු.120,000/- ක් අයකරගෙන ඇත.
- “ප්‍රාදේශීය සභාවට” රු.500,000/- ක් වටිනා බෝතල් කළ පළතුරු බීම, සමාගම විසින් පරිත්‍යාග කර තිබේ.

(5) 2025 මාර්තු 31 දිනට, දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ:

වත්කම් (පිරිවැයට)	2024 අප්‍රේල් 01 දිනට ශේෂය (රු.)	එකතු කිරීම් (රු.)	ඉවත් කිරීම් (රු.)	2025 මාර්තු 31 දිනට ශේෂය (රු.)
ඉඩම	4,500,000	-	-	4,500,000
ගොඩනැගිලි	15,000,000	1,500,000	-	16,500,000
පිරියත සහ යන්ත්‍ර	7,000,000	4,500,000	-	11,500,000
ගෘහභාණ්ඩ සහ සවි කිරීම්	2,800,000	-	-	2,800,000
මෝටර් වාහන	18,600,000	-	3,200,000	15,400,000,
එකතුව	**47,900,000**	**6,000,000**	**3,200,000**	**50,700,000**

- 2022/23 තක්සේරු වර්ෂයේදී රු.3,200,000/- ක පිරිවැයකට මිලදී ගත් මෝටර් ලොරි රථයක්, 2024 දෙසැම්බර් මාසයේදී රු.2,850,000/- කට විකුණන ලදී. මෙම ලොරි රථය, භාණ්ඩ බෙදා හැරීමට භාවිත කරන ලදී.
- වර්ෂය තුළදී, සමාගම නව යන්ත්‍රයක් රු.4,500,000/- කට මිලදී ගන්නා ලදී.
- රු.6,000,000/- ක් වටිනා කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ මෝටර් කාර් රථය හැර, අනෙකුත් සියළු මෝටර් වාහන බෙදාහැරීමේ රථ වේ.
- 2024 අප්‍රේල් 01 දිනට, පැවති කිසිදු වත්කමක් බදු අරමුණු සඳහා සම්පූර්ණයෙන් ක්ෂය කර නොමැත.

(6) වර්ෂය තුළදී, විශ්‍රාම ගත් සේවකයෙකුට රු.900,000/- ක් පාරිතෝෂික වශයෙන් ගෙවා තිබේ.

(7) 2024/25 තක්සේරු වර්ෂය සඳහා ඉදිරියට ගෙන එන ලද ගලපන ලද බදු අලාභය රු.650,000/- කි.

(8) බැංකුව, පොලී ආදායම මත 5% බැගින් අත්තිකාරම් ආදායම් බදු [Advance Income Tax (AIT)] / රඳවාගැනීමේ බදු [Withholding Tax (WHT)] අඩුකරගෙන තිබේ.

(9) සමාගම, 2024/25 තක්සේරු වර්ෂය සඳහා, ස්ව-තක්සේරු පදනම මත ආදායම් බදු කාර්තුමය වාරික වශයෙන් රු.6,500,000/-ක් ගෙවා තිබේ.

(10) කුලී ආදායම මත, කුලී නිවැසියාගෙන් සමාගමට රඳවා ගැනීමේ බදු (WHT) සහතික ලැබී තිබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

2024/25 තක්සේරු වර්ෂය සඳහා **සීමාසහිත ක්‍රිස්ටල් බෙවරේජස් (පෞද්ගලික) සමාගමේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) තක්සේරු කළ හැකි ආදායම,

(b) බදු අයකළ හැකි ආදායම,

(c) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ

(d) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද / (වැඩිපුර ගෙවූ බද්ද).

(සැ.යු: යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි.) (ලකුණු 25)

09 වන ප්‍රශ්නය

මෙවන් වාසික පුද්ගලයෙකු වන අතර, දැනට ශ්‍රී ලංකාවේ ඇඟළුම් සමාගමක ජ්‍යෙෂ්ඨ කළමනාකරුවකු වශයෙන් සේවය කරයි.

2024/25 තක්සේරු වර්ෂයට (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) අදාළව **මෙවන්** සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) **සේවා නියුක්තියෙන් ලද ආදායම:**

- දළ වැටුප - මාසිකව රු.560,000/- කි.
- සමාගම, ඉන්ධන සමඟ මෝටර් රථයක් (2000 cc) ඔහුට සපයා තිබේ.
- වර්ෂය තුළදී, ඔහුට ශල්‍යකර්මයකට මුහුණ දීමට සිදුවූ අතර, සම්පූර්ණ රෝහල් ගාස්තුව වූ රු.480,000/- ක මුදල, සමාගම විසින් දරණ ලදී. සමාගමේ සියළු සේවකයින්ට සමාන කොන්දේසි මත වෛද්‍ය ප්‍රතිලාභ ලබාගත හැකිය.
- ඔහු, ඔහුගේ පවුල සමඟ විදේශ සංචාරයක යෙදුනු අතර, නවාතැන් සහ ගුවන් ටිකට්පත් පිරිවැය වූ රු.960,000/- ක මුදල, සමාගම විසින් දරණ ලදී.
- **මෙවන්,** සමාගම විසින් සපයන ලද තට්ටු නිවාසයක වාසය කරන අතර, ඒ සඳහා සමාගම විසින් මාසයකට රු.90,000/- ක කුලියක් ගෙවයි. සමාගම විසින් සපයන ලද වාසස්ථානය වෙනුවෙන් සමාගම ගෙවන කුලියෙන් 50% ක මුදලක්, මාසිකව ඔහුගේ වැටුපෙන් අඩු කරනු ලැබේ.
- වර්ෂය සඳහා අඩුකරන ලද අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද [Advance Personal Income Tax (APIT)] රු.2,250,000/- කි.

(2) **මෙවන්,** ආයතනික සේවාදායකයින් සඳහා තාවකාලික පදනමින් ව්‍යාපාර කළමනාකරණ උපදේශන සේවා සපයයි. උපදේශන සේවා සම්බන්ධයෙන් 2024/25 තක්සේරු වර්ෂය සඳහා ආදායම් සහ වියදම් විස්තර පහත දැක්වේ:

	රු.
උපදේශන සේවා ආදායම	5,840,000
අඩු කළා: වියදම්	
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	630,000
කාර්යාල කුලිය	1,000,000
විදුලිය සහ දුරකතන ගාස්තු	280,000
බැංකු ණය පොලිය	230,000
ශුද්ධ ලාභය	**3,700,000**

බැංකු ණය පොලිය ගෙවා ඇත්තේ ඔහුගේ පුතාට නිවසක් ඉදිකිරීම සඳහා ලබාගත් ණය මුදලක් මතයි.

(3) ඔහුට පාරම්පරිකව උරුමයෙන් හිමිවූ නිවසක් මාතලේ තිබෙන අතර, එය මාසිකව රු.75,000/- ක කුලියකට අසල්වාසියෙකුට කුලියට දී තිබේ. මෙම නිවසේ වරිපනම් තක්සේරුව රු.150,000/- ක් වන අතර, කුලී නිවැසියා විසින් 30% බැගින් වරිපනම් ගෙවා තිබේ.

(4) වර්ෂය තුළදී, **මෙවන්** ට පහත සඳහන් පොලී ආදායම් ලැබී තිබේ: *(රු.)*

විස්තරය	ලැබුණු දිනය (කල් පිරුණු දිනය)	මුදල (දළ)	අඩුකළ අත්තිකාරම් ආදායම් බද්ද (AIT) / රඳවා ගැනීමේ බද්ද (WHT)
ස්ථාවර තැන්පතු මත පොලිය	2024.12.15	800,000	40,000
භාණ්ඩාගාර බිල්පත් මත පොලිය	2025.01.30	1,000,000	-

(5) වර්ෂය තුළදී, **මෙවන්** ට ඔහුගේ ආයෝජනවලින් පහත සඳහන් ආදායම් ලැබී තිබේ:

- **මෙවන්,** 2024 සැප්තැම්බර් මාසයේදී නිල ලැයිස්තුගත පොදු සමාගම්වල කොටස් විකිණීමෙන් රු.195,000/- ක ලාභයක් උපයා ඇත.
- 2025 මාර්තු මාසයේදී නිල ලැයිස්තුගත පොදු සමාගම්වලින් ලැබුණු ලාභාංශ ආදායම (ලැබුණු ලාභාංශවලින් ගෙවන ලද) රු.240,000/- කි.

(6) 2024 අප්‍රේල් මාසයේදී, ඔහු රු.400,000/- ක් වටිනා පොත් *"ශ්‍රී ලංකා බෞද්ධ සහ පාලි විශ්ව විද්‍යාලයට"* පරිත්‍යාග කරන ලදී.

(7) **මෙවන්,** 2024/25 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු වාරික ගෙවීම් වශයෙන්, රු.900,000/- ක් ගෙවා තිබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

2024/25 තක්සේරු වර්ෂය සඳහා **මෙවන්ගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න:**

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි / (වැඩිපුර ගෙවූ) ආදායම් බද්ද, සහ

(d) බදු නිදහස් ආදායම, (වේ නම්).

***(සැ.යු:** යම් ආදායමක් බද්දට යටත් නොවේ නම්, ඒ බව පැහැදිලිව සඳහන් කළ යුතුයි.)* (ලකුණු 25)

C කොටසෙහි අවසානය

කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
දැනුම (1)	තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම	අඳින්න	හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම.
		සම්බන්ධ කරන්න	තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම.
		සඳහන් කරන්න	ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම.
		හඳුනා දක්වන්න	සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම.
		ලැයිස්තුගත කරන්න	විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
අවබෝධය (2)	අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම.	හඳුනාගන්න	අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම.
		අර්ථකතනය කරන්න	වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න.
		විස්තර කරන්න	ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න.
		පැහැදිලි කරන්න	අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම.
		නිර්වචනය කරන්න	ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
භාවිතය (3)	අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම.	සසඳන්න	තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න.
		ප්‍රස්තාර දක්වන්න	ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න.
		තක්සේරු කරන්න	වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න.
		විසඳන්න	ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම.
		පිළියෙල කරන්න	විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම.
		ප්‍රදර්ශනය කරන්න	උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම.
		ගණනය කරන්න	ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම.
		භාවිත කරන්න	ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
විශ්ලේෂණය (4)	අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම.	සන්නිවේදනය කරන්න	තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම.
		සැකිල්ලක් සේ දක්වන්න	සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම.
		අසමානතා බලන්න	අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම.
		සමානකම් බලන්න	සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම.
		විමසන්න	තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම.
		වෙනස්කොට දක්වන්න	යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම.
		විශ්ලේෂණය කරන්න	විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න.